SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
06	භූගෝල විද්‍යාව	I,II	පැය 02

නම :- ..... විභාග අංකය :- .....

සැලකිය යුතුයි:

*** I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.**

*** II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**

I පත්‍රය

❖ **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(ඊසාන . බටහිර , ග්‍රාම නිළධාරී කොට්ඨාසය, ජීව වායු, ශාක, ආසියා, අප්‍රිකා)

(01) පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය ..... යි.

(02) උතුරු දිශාව හා නැගෙනහිර දිශාව අතර ..... දිශාව පිහිටා ඇත.

(03) ජීවීන්ගේ පැවැත්ම සඳහා ..... ඉතා ප්‍රයෝජනවත් වේ.

(04) අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන ..... උත්පාදනය කළ හැකි ය.

(05) ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ..... මහාද්වීපය තුළ ය.

❖ **අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(06) ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,

(1) කොළඹ නවම් මාවතේ පිහිටා ඇත. (2) කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත.

(3) කොළඹ කොටුවේ පිහිටා ඇත. (4) බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටා ඇත.

(07) පස බුරුල් කිරීම හා පස සරු කිරීමට දායක වන සතෙකි.

(1) කපුටා (2) බත්කුරා (3) වවුලා (4) ගැඩවිල් පණුවා

(08) පාරම්පරික ශිල්ප ඥානය පදනම් කරගෙන කරනු ලබන වේවැල් භාණ්ඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ වූ ප්‍රදේශයකි.

(1) මොරටුව (2) පිළිමතලාව (3) රදාවඩුන්න (4) දුම්බර

(09) ජලය හිඟවීමෙන් ඇතිවිය හැකි ගැටලුවක් **නොවන්නේ,**

(1) වැසි ජල ටැංකි භාවිතයට හුරුවීම (2) පස නිසරු වීම

(3) ලෙඩ රෝග ව්‍යාප්ත වීම (4) ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වීම

(10) ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් වෙන් වන පටු මුහුදු තීරය,

(1) මලක්කා සමුද්‍ර සන්ධිය (2) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය

(3) පෝක් සමුද්‍ර සන්ධිය (4) බීජිං සමුද්‍ර සන්ධිය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

❖ **අංක 11 - 15 දක්වා ප්‍රකාශ හරි නම් ✓ලකුණ ද, වැරදි නම් ✗ ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(11) යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායුගෝලයේ ස්වභාවය දේශගුණය යනුවෙන් හැඳින්වේ. ( )

(12) "අවිච්චියා" සංචාරක පක්ෂියෙකි. ( )

(13) ගීතකරණය භාවිතයේ දී දොර අරින වාර ගණන සහ දොර හැර තැබීමේ කාලය හැකි තරම් අඩු කිරීමෙන් විදුලිය අපරිමැසිය හැකි ය. ( )

(14) ශ්‍රී ලංකාවේ අගනුවර කොළඹ නගරයයි. ( )

(15) වර්තමාන ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ වේගයෙන් දියුණුවන රටකි. ( )

❖ **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.**



(16) පෝක් සමුද්‍ර සන්ධිය දැක්වෙන්නේ ..... අක්ෂරයෙනි.

(17) ඉන්දියාව ..... අක්ෂරයෙන් දැක්වේ.

(18) පැසිපික් සාගරය දැක්වෙන්නේ ..... අක්ෂරයෙනි.

(19) තායිවානය ..... දැක්වේ.

(20) අරාබිය දැක්වෙන්නේ ..... අක්ෂරයෙනි.

(ලකුණු 2 x 20 = 40)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK


II පත්‍රය

*** පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

*** අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සපයන්න.**

*** පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) (i) පහත රූපය තුළින් පරිපාලන කොට්ඨාස ධූරාවලිය තුළ ඔබේ පාසලේ පිහිටීම දක්වා ඇත. මෙහි A, B, C, D අක්ෂරවලට අදාළ නාමයන් පිළිවෙළින් ලියා දක්වන්න.



(ලකුණු 04)

(ii) බස්නාහිර පරිපාලන ඒකකයට අයත් දිස්ත්‍රික්ක තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) පාසලක අනන්‍යතාව නිවැරදිව දැක්වෙන පරිදි ඔබේ පාසලේ නාමය ලියන්න. (ලකුණු 03)

(iv) ඔබ පාසලේ පිහිටීමේ දළ සැලැස්මක් ඇඳ දක්වන්න. (ලකුණු 06)

(02) (i) ශාකවලින් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් සතුන්ගෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න.

A - ඇටිකුකුළා B - ගිරවා

C - මී මැස්සා D - වේයා (ලකුණු 04)

(iii) ඔබ ප්‍රදේශයේ ප්‍රජාව විසින් පිහිටුවාගත් සමිති සමාගම් තුනක් නම් කර ඒවායින් ඉටුවන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 05)

(03) (i) පරිසරයේ මූලිකාංග වන භූමිය, විවිධ අයුරින් ප්‍රයෝජනයට ගන්නා ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) නිවස අවට භූමිය විධිමත්ව පරිහරණය කිරීම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) භූමිය අවිධිමත් ලෙස පරිහරණය කරන අවස්ථා පහක් ලියන්න. (ලකුණු 05)

(04) (i) ශ්‍රී ලංකාවේ පිහිටීම දේශගුණයට බලපාන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා මෙරට ජන සමාජයේ ඇතිවූ වෙනස්කම් පහක් ලියන්න. (ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK


(05) (i) පාසල අවට වටපිටාවේ භූගෝලීය ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

කාලගුණික අංග	මනින උපකරණය
a) උෂ්ණත්වය	.....
b) වර්ෂාපතනය	.....
c) සුළඟේ වේගය	.....
d) සුළං හමන දිශාව	.....

(ලකුණු 04)

(iii) වර්ෂාව ඇතිවන ආකාරයට අදාළ ක්‍රියාවලිය රූප සටහනේ දක්වා ඇති අංක පිළිවෙලින් ලියන්න.



(ලකුණු 05)

(06) (i) වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) බල ශක්ති ඉල්ලුම ඉහළ යාමට බලපාන හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) නිවසේ බල ශක්තිය පරිහරණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණු පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)

(07) (i) ශ්‍රී ලංකාව හැරුණු විට ලෝකයේ වෙනත් දූපත් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ඉහත ඔබ නම් කළ ස්ථාන හතරෙන් එක් ස්ථානයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only